www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

## පෙරටුගාමී සමාජවාදී පක්ෂය

# නව දක්ෂිනාංශික ව්‍යාජ-වාම කන්ඩායමක්

**කේ. රත්නායක විසිනි**
**2013 දෙසැම්බර් 20**

*මෙහි පලවන්නේ කොටස් හතරකින් යුතු ලිපි මාලාවක පලමුවැන්නයි.*

ජනතා විමුක්ති පෙරමුනෙන් (ජවිපෙ) භේද වූ කන්ඩායමක් ගිය අවුරුද්දේ උත්සවශ්‍රීයෙන් පෙරටුගාමී සමාජවාදී පක්ෂය (පෙසප) පිහිටුවා ගැනීම නිවේදනය කලේය. ව්‍යාජ වම්මුන්ගේ නව සමසමාජ පක්ෂය (නසසප) හා එක්සත් සමාජවාදී පක්ෂය (එසප), එම පක්ෂය පිහිටුවීම ලංකාවේ දේශපාලන තත්වය තුල ඇතිවූ "ප්‍රගතිශීලී" වර්ධනයකැයි වග වර්නනා කලහ.

මෙම සලුපිලි ඇන්දවීම කීතු කරමින්, පෙසප පසුගිය අවුරුදු දෙකකට ආසන්න කාලය තුල සනාථ කර ඇත්තේ, එය වනාහී ධනවාදී පද්ධතියට ද ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආන්ඩුවට ද එරෙහිව පෙරලිකාරී වන වැඩකරන ජනතාවට හා තරුනයින්ට උගුල් මානන දක්ෂිනාංශික සංවිධානයක් බව යි.

දශක ගනනාවක් තිස්සේ ජවිපෙ ප්‍රතිගාමී පිලිවෙත් ආරක්ෂා කල පෙසප නායකයින් ඉන් කැඩී ගියේ එය බරපතල ම අර්බුදයක ගිලෙන තත්වයක ය. ලංකාවේ හා ජාත්‍යන්තර ජනමාධ්‍යයන් ජවිපෙ "මාක්ස්වාදී" පක්ෂයකැයි පින්තාරු කරන නමුත් ඊට මාක්ස්වාදය සමග කිසි කලෙකවත් සම්බන්ධයක් තිබුනේ නැත. 1960 ගනන් අග ගම්බද තරුනයන් අතර එම පක්ෂය සංවිධානය කෙරුනේ මාඕවාදය හා සිංහල ජනතාවාදය උඩ පදනම් වෙමින් සන්නද්ධ අරගලය උත්කර්ෂයට නංවමිනි. 1964 ලංකා සමසමාජ පක්ෂය (ලසසප) ධනපති ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සමග සභාගයකට එක්වෙමින් සිදු කල ඓතිහාසික පාවාදීමේ කොන්දේසි තුල විරක්ෂාභාවයේ හා දරිද්‍රතාවේ ගිලී පෙරලිකාරී වෙමින් සිටි ගම්බද තරුනයින් ජවිපෙ දුටුවේ "වාමාංශික" සංවිධානයක් ලෙස ය.

සන්නද්ධ අතිධාවනකාරීත්වයේ සිට පාර්ලිමේන්තු දේශපාලනයක් දක්වා පැද්දුනු ජවිපෙ දැන් ධනපති දේශපාලන සංස්ථාපිතයට තරයේ ම බද්ධ වූ සංවිධානයකි. ජවිපෙ දෙමල ජනයාට එරෙහි වර්ගවාදී යුද්ධයට සහයෝගය දුන්නේ ය; 1988-1990 දී කම්කරුවන්ට හා දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව ෆැසිස්ට් ප්‍රහාර මුදා හැරියේ ය. 2004 දී එවක ජනාධිපති වූ චන්ද්‍රිකා කුමාරතුංග සමග හවුල් ආන්ඩුවකට ඇතුලු වූවේ ය. රාජපක්ෂ ආන්ඩුව යලි ඇරඹූ යුද්ධයට ද වැඩකරන ජනයාට එල්ල කල ප්‍රහාරවලට ද සහයෝගය දුන් ජවිපෙ ඉන් අනතුරුව දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) සමග සන්ධානගත වී හිටපු යුද හමුදාපති සරත් ෆොන්සේකා පොදු ජනාධිපති අපේක්ෂකයා ලෙස ඉදිරිපත් කිරීමට හවුල් විය. මේ ප්‍රතිගාමී උපාමාරු මුදුන් පෙත්තට ගෙන යමින් ජවිපෙ ඇමෙරිකාවේ හිටපු ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් අධිරාජ්‍යවාදී අවශ්‍යතා මත 2001 සැප්තැම්බරයේ නිව් යෝර්ක් නගරයට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් පසු ඇරඹූ ඊනියා ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයට සහයෝගය පල කලේ ය.

මේ ප්‍රතිගාමී ක්‍රියා කලාපය නිසා ජවිපෙ තරුනයින් හා දුගීන් අතර අපකීර්තියට පත්ව සිටියි. එහි එක් දර්ශකයක් වූයේ පක්ෂයේ පාර්ලිමේන්තු ආසන සංඛ්‍යාව 2004 දී 39ක් ව තිබී 2010දී ආසන තුනකට පල්ලම් බැසීම යි.

කල් ඉකුත් වී, මෙම දක්ෂිනාංශික පිලිවෙත්වලින් සමහරක් ගැන විවේචන එල්ල කරමින් පෙසප නායකයන් ජවිපෙන් භේද වූයේ, පක්ෂයේ ආරම්භකයා වූ රෝහන විජේවීරගේ උරුමය වෙතට පෙරලා යන බව ප්‍රකාශ කරමිනි. ඇත්තට ම නම් මේ "උරුමය", අවස්ථාවාදී හා ප්‍රතිගාමී එකකි. ජවිපෙ ගැන කලකිරුනු තරුනයින්, ඊට එරෙහිව වාගාලාප දෙඩූ අලුත් පක්ෂයට ඇදී ගියේ ඉන් විකල්පයක් ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වෙමිනි. ජවිපෙ විසින් පාලනය කෙරුනු අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලය (අවිශිබම) ද කැඩී ගිය කන්ඩායමට එක් විය.

පෙසප ද දැන් දේශපාලන අර්බුදයක ගිලී ඇත. ජවිපෙ ගැන විස්වාසය බිඳී එක් වූ තරුනයින් බොහෝ දෙනෙක් පෙසප අත්හැර ගොසිනි. පක්ෂයේ මුද්‍රිත පුවත්පත් දෙක "තාවකාලිකව" වසා දමා තිබේ. ඇතැම්

නායකයන් පක්ෂය අත් හැර සරු තනබිම් සොයා ගොස් ඇත. පෙසප නායකයෙකු වන සේනාධීර ගුනතිලක ද නේෂන් පුවත්පතට ප්‍රකාශ කලේ, "මතභේද නිසා අපේ පක්ෂයේ සාමාජිකයන් කිහිප දෙනෙක්" පක්ෂයට අහිමි වී ඇති බවයි.

පෙසප දැන් කලෙක සිට තොරොම්බල් කල "වාම සංවිධාන" යලි කාන්ඩ ගස්වා ගැනීමේ ව්‍යායාමය පෙරට දමා ඇත. පෙසප මේ සඳහා ධනේශ්වර කන්ඩායම් වලට හා ව්‍යාජ වම්මුන්ගේ සංවිධානවලට ආරධනා කර ඇත. පෙසප දැන් වෙර දරන්නේ තමන් ද ඇතුලු කන්ඩායම්වල අතීත ප්‍රතිගාමී ක්‍රියාවලට අලුත් වහන්තරාවක් දමාගෙන කම්කරු පන්තිය පීලී පැන්නවීමට හා එහි අරගල මැඩලීමට පලල් වාම පෙරමුනක් ඇටවීමට යි. පෙසප අන් ඊනියා වම්මුන් මෙන් ම භීතියට පත්ව සිටින්නේ ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනයේ ආඥා පරිදි කප්පාදු පිලිවෙත් ක්‍රියාවට දමන රාජපක්ෂ ආන්ඩුවට විරුද්ධව, ලෝක පරිමානව සිදුවන්නා සේ, කම්කරුවන්ගේ විප්ලවවාදී අරගල ලංකාව තුල ද පුපුරා එනු ඇති නිසා ය.

නසසප හා එසප මෙම කාන්ඩ ගැසීමට හවුල්කර ගැනීම එහි දක්ෂිනාංශික ස්වභාවය ප්‍රදර්ශනය කරයි. මෙම පක්ෂ ධනේශ්වරයේ සෑම කන්ඩායමක් සමග ම එක් වීමෙන් ද දැන් යූඇන්පිය සමග පෙල ගැසීමෙන් ද දුර්දාන්ත අවස්ථාවාදී ද්‍රෝහීත්වය කර පින්නා ගෙන සිටී.

ග්‍රීසියේ සයිරිසා (රැඩිකල් වාම සභාගය) සංවිධානය ලංකාවේ වාම කාන්ඩ ගැසීමකට හොඳම මොඩලය ලෙස පෙසප පින්තාරු කරයි. ගිය අවුරුද්දේ සැප්තැම්බර් 2 දා පෙසප පුවත්පතක් වන ජනරල "ග්‍රීසියේ සයිරිසා වැනි රැඩිකල් වමක සුන්දර බලාපොරොත්තුව දැල්වීම සඳහා වන ඒ කතිකාව" එනම් වාම කන්ඩායම් කතිකාවේ යෙදීමේ උවමනාව, අවධාරනය කලේ ය. ධනේශ්වර හා ව්‍යාජ වාම කන්ඩායම්වල සයිරිසා හවුල ග්‍රීසිය තුල ධනවාදයට එරෙහිව කම්කරු පන්තිය විප්ලවවාදීව බලමුලු ගැන්වීමට විරුද්ධ පවුරක් ලෙස ක්‍රියාකරන අතර ම අධිරාජ්‍යවාදී යුරෝපා සංගමය සමග එකට කටයුතු කිරීමට එකහෙලා පක්ෂපාතීත්වය ප්‍රකාශ කර ඇත. සයිරිසා නායක ඇලෙක්සැන්ඩර් සිප්රාස් වොෂිංටනය ද ඇතුලු අධිරාජ්‍යවාදී ලෝකයේ අගනුවරවල කරක් ගසමින් ඔහුත් ඔහුගේ සංවිධානයත් ගැන බය වීමට කිසිදු හේතුවක් නැති බව ඒත්තු ගන්වමින් සිටී.

සයිරිසා මොඩලය පෙසප විසින් තොරොම්බල් කරනු ලැබීම, එය ඉටු කරන්ට යන ප්‍රතිගාමී ක්‍රියා කලාපය කල් තියා ප්‍රකාශයට පත් කිරීමකි.

ලෝක ධනවාදයේ අර්බුදය ගැඹුරුවන තතු තුල විප්ලවවාදී අරගල වර්ධනය වෙද්දී කම්කරු පන්තිය පීලි පැන්නවීමට රටක් රටක් පාසා අලුත් වාම කාන්ඩ ගැසීම් සිදුවෙමින් පවතී. සයිරිසා හැරුනු විට, ප්‍රන්සයේ නව ධනපති-විරෝධී පක්ෂය, එක්සත් ජනපදයේ ජාත්‍යන්තර සමාජවාදී සංවිධානය සහ ඊජිප්තුවේ විප්ලවවාදී සමාජවාදියෝ ධනපති සහ අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රයන්ට සහයෝගය දෙන මේ කන්ඩායම් අතරින් කිහිපයකි.

පෙසප, ජවිපෙ දේශපාලනයෙන් තමන් බිඳුනු බවට කයිවාරු ගසයි. එහෙත් පසුගිය මාසවල එහි ක්‍රියාකලාපයෙන් පෙන්නුම් කර ඇත්තේ මෙම පක්ෂයට ජවිපෙ දේශපාලන පිලිවෙතින් මොනම මූලික බිඳීමක්වත් නැති බව යි.

පක්ෂයේ ප්‍රධාන පදනම ලෙස සැලකෙන ශිෂ්‍යයන් අතර පෙසප ක්‍රියාකලාපය ඊට එක් සාක්ෂියකි. ජවිපෙ මෙන් ම පෙසප ද විශ්ව විද්‍යාල සිසුන් අතර ක්‍රියා කරන්නේ අව්ශිබමය හරහා ය. පහසුකම් නැතිකම, සරසවි අධ්‍යාපනය පුද්ගලීකරනය සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් අහෝසි කිරීම නිසා ශිෂ්‍යයෝ රැඩිකලීකරනය වී සිටිති. නමුත්, රාජපක්ෂ ආන්ඩුව බලපෑම්වලට නතුකර ගත හැකියයි බොරු දෙසාබාමින් සිසුන් අතර කෝපය වාෂ්ප කර දැමීමට අව්ශිබමය එකකට පසු තවෙකක් බැගින් විරෝධතා සංවිධානය කරයි. සබරගමු සිසුන්ගේ අයිතීන්ට ආන්ඩුව ප්‍රහාර එල්ල කිරීමට විරුද්ධත්වය පෑම සඳහා අව්ශිබමය හැරුනේ අධිරාජ්‍යවාදීන් විසින් හසුරුවන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සංවිධානය වෙත යි.

මෙලෙස නිරර්ථක විරෝධතා වංකගිරියක් තුල සිසුන් හිර කරමින් ආන්ඩුවේ අඛන්ඩ ප්‍රහාරයකට පෙසප දොර හැර ඇත. සමාජවාදී සමානතා පක්ෂය (සසප) ද එහි සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර තරුනයෝ සහ ශිෂ්‍යයෝ ද, නිදහස් අධ්‍යාපනය රැක ගැනීම සඳහා රාජපක්ෂ ආන්ඩුවට එරෙහිව සමාජවාදී ප්‍රතිපත්ති මත සටන් කිරීමට කම්කරු පන්තිය වෙත ශිෂ්‍යයන් හරවා ගැනීමට කරන අරගලයට පෙසප හා අව්ශිබම මාරාන්තික ලෙස සතුරු ය.

සමාජවාදී ප්‍රතිපත්ති මත රාජපක්ෂ ආන්ඩුවට එරෙහි දේශපාලන අරගලයක් බලමුලු ගැන්වීමට පෙසප සතුරුකම පසුගිය අවුරුද්දේ මාස දෙකකට අධික කාලයක් පැවැති විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වර්ජනයේ දී හෙලිදරව් විය. සසප වැඩපිලිවෙලට එරෙහිව ජනරල කතුවැකියක් තුල මෙසේ ලීවේ යඃ "අධ්‍යාපනයට දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට හයක් වෙන් කිරීම නැමැති කාරනාව දක්වා දැන් මෙම 'වෘත්තීය අරගලය' රැගෙනවුත් තිබේ. . . එය එසේ

කිරීමෙන් අධ්‍යාපන ගැටලුව විසඳෙයි ද? නැත. එහෙත් එය ස්ථිරලෙස ම 'සිත්ගන්නා සුලු' ප්‍රතිසංස්කරනයක් වනු ඇත. අට අනූවක් රෝග හා නවානුවක් ව්‍යාධීන් සුවපත් කරගැනීම සඳහා (ජාතික ගැටලුව ද ඇතුලු) සමාජවාදය ස්ථාපිත කරන තෙක් බලා සිටීමේ විනෝදාංශයක් අපට නැත."

මේ සඳහන් කරන්නේ රාජපක්ෂ ආන්ඩුවෙන් "සිත් ගන්නා සුළු ප්‍රතිසංස්කරන" දිනා ගත හැකි බවයි, සමාජවාදය සඳහා අරගලය නම් බලා සිටීමට බැරිතරම් දුරස්ථ එකක් බවයි. ආචාර්යවරුන්ගේ සංගමය රාජපක්ෂ ආන්ඩුවෙන් කෙසේ හෝ ඉල්ලීම් දිනා ගැනීමේ නමින් සරසවි ගුරු අරගලය ආන්ඩුව සමග ගනුදෙනු කිරීමට කොටුකර පාවාදීමට ක්‍රියා කරන විට, පෙසප ඊට හවුල් වූයේ එලෙස ය.

ජවිපෙ වර්ගවාදී දේශපාලනයට තමන් විරුද්ධ බව මවා පෙන්වීමට පෙසප මංමුලාසහගත ලෙස වැයම් කරයි. එහි කොටසක් ලෙස මෙම පක්ෂය රාජපක්ෂ ආන්ඩුව මානුෂික අයිතීන් උල්ලංඝනය කිරීම ගැන විවේචනය කරයි. මෙම බොරු උනන්දුව දෙමල ජාතිය සම්බන්ධයෙන් තම වර්ගවාදී පිලිවෙත ආවරනය කර ගැනීමේ තැතකි.

ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා ඊනියා ප්‍රායෝගික මූලිකත්වය ගැනීම නමින් පෙසප පල්ල ගිය පුරසාරමක් දොඩා ඇත. මේ 'ප්‍රායෝගික මූලිකත්වය ගැනීමේ' නමින් පෙසප "සම අයිතිවාසිකම් ව්‍යාපාරයක්" දියත් කලේ ය. (මෙම ව්‍යාපාරය දැන් පෙනෙන්ට නැත). එය ඕනෑම ධනේශ්වර කන්ඩායමක් ඉදිරිපත් කරනු ඇති වංචනික ඉල්ලීම් 16ක් ප්‍රසිද්ධ කලේ ය. දෙමල ජනයාට තමන්ගේ ම භාෂාවෙන් කටයුතු කිරීමට ඉඩ සැලසීම, යුද්ධයෙන් විනාශ වූ දේපොලවලට වන්දි ගෙවීම, දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම, සරනාගතව පිටරට ගොස් සිටින අයට ලංකාව තුල හොඳ ජීවිතයක් සහතික කිරීම හා උතුරු-නැගෙනහිර මිලිටරි පන්නයේ පාලනය අවසන් කිරීම ඒ ඉල්ලීම් අතර වේ.

එහෙත් පෙසප රාජපක්ෂ පාලනය ද ඇතුලු සියලු ආන්ඩු ගෙන ගිය වර්ගවාදී යුද්ධයට විරුද්ධ වී නැතිවා පමනක් නොව උතුරෙන් හා නැගෙනහිරින් කොන්දේසි විරහිතව හමුදා ඉවත් කිරීමේ ඉල්ලීමට ද විරුද්ධ ය.

තම ගුරා වන ජවිපෙ අනුයමින් පෙසප ඉන්දියානු විරෝධය ඇවිස්සීමට ද හවුල් වී සිටී. ඉන්දු-ලංකා ගිවිසුම අනුව ඇති කල 13 වන ව්‍යවස්ථා සංශෝධනයට එම පක්ෂයේ විරුද්ධත්වයෙන් පෙන්නුම් කරන්නේ එය යි. ජවිපෙ හා අනෙකුත් ධනපති කන්ඩායම් මෙන් ම පෙසප ප්‍රකාශ කරන්නේ මෙම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ඉන්දියාව ලංකාවට අත දමා ඇති බවයි.

1987 ජූලි ඉන්දියාවේ හා ලංකාවේ ආන්ඩු විසින් ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කරනු ලැබුවේ ලංකාවේ ධනේශ්වර ඒකීය රාජ්‍යය ආරක්ෂා කිරීමට, දෙමල විමුක්ති කොටි සංවිධානය නිරායුධ කිරීමට සහ දෙමල ප්‍රභූවට සීමිත පාලන බලතල ලබා දීම සඳහා ය. රාජපක්ෂ ආන්ඩුව දැන් 13 වන ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධව සිංහල-බෞද්ධ වර්ගවාදී කන්ඩායම්වල පිටුබලය ද කැඳවා ගනිමින් වර්ගවාදය ඇවිස්සීමේ යෙදී සිටින්නේ කම්කරු පන්තිය වාර්ගික රේඛා ඔස්සේ බෙදා සිය ප්‍රහාර තීව්‍ර කිරීමට ය. ජවිපෙ හා පෙසප ආන්ඩුවේ මෙම ව්‍යාපාරය සමග පෙලගැසී සිටී.

මෙම ස්වෝත්තමවාදී දේශපාලනයන්ට එරෙහිව පිහිටා සිටිමින් ම සසප ඉන්දු-ලංකා ගිවිසුමට ද 13 වන ව්‍යවස්ථා සංශෝධනයට ද විරුද්ධව නැගී සිටින්නේ කම්කරු පන්තියේ ජාත්‍යන්තරවාදී ආස්ථානයේ පිහිටා ගෙන ය. එනම්, සිංහල, දෙමල, මුස්ලිම් කම්කරුවන් එකමුතුව ගොඩ නගා ගෙන, දකුනු ආසියාවේ සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා - ඊලම් සමාජවාදී සමූහාන්ඩුවකට සටන් වැදීමේ ඉදිරිදර්ශනය මත ය. එය ජාත්‍යන්තර පරිමාන සමාජවාදය සඳහා කරන අරගලයක කොටසකි.

මෙම අරගලයට එකහෙලා විරුද්ධ පෙසප සමාජවාදය යන වචනය ව්‍යාජව හරඹ කරන්නේ ධනපති ක්‍රමය ආරක්ෂා කිරීමේ තම ක්‍රියා කලාපය ආවරනය කර ගැනීමට ය.

© www.wsws.org